RG/MBD/01/චක්‍රලේඛ

2023.12.01

චක්‍රලේඛ අංකය -08 /2023

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් මඟින්,
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

<u>ලියාපදිංචි වතුවල සිදුවන උපත් හා මරණ ලියාපදිංචි කිරීම</u>

1951 අංක 17 දරණ උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 20 වන හා 34 වන වගන්ති යටතේ වත්තක සිදුවන උපතක් හෝ මරණයක් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් බලතල දක්වා ඇත. ඒ අනු ලියාපදිංචි වතුවල සිදුවන උපත් මරණ පිළිබඳ දැනුම්දීම සම්බන්ධයෙන් බලතල පවරා ඇත්තේ වත්තේ ව අධිකාරී තැනටය.

02. නමුත් මේ වන විට බොහෝ වතුවල වතු අධිකාරීවරයෙකු හෝ වතු රෝහලක් නොමැති අවස්ථා දක්නට ලැබෙන අතර එවැනි අවස්ථාවලදී වතුවල සිදුවන උපත් හා මරණ ලියාපදිංචි කිරීමේදී ගැටළුකාරී තත්ත්වයන් පැන නගින බව වාර්තා වී ඇත.

03. එසේම වර්තමානයේ සෑම වතු බල ප්‍රදේශයක්ම පාහේ ආවරණය වන පරිදි ග්‍රාම නිලධාරීවරයෙකු පත්වී සිටින බැවින් උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 02 වන වගන්තිය යටතේ වන රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ බලතල ප්‍රකාරව ඉදිරියේදී පනත සංශෝධනය කරන තෙක් ලියාපදිංචි වත්තක වතු රෝහලක් නොමැති හෝ වතු අධිකාරීවරයෙකු නොමැති අවස්ථාවක ග්‍රාම නිලධාරී වාර්තාව (ලි.ප.බී.23)/(ලි.ප.බී.24) මත පදනම්ව උපත්/මරණ ලියාපදිංචි කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් අනුමැතිය ලබා දී ඇත. (ඇමුණුම)

04. ඒ අනුව ඉහත සඳහන් අයුරින් ලියාපදිංචි වත්තක වතු රෝහලක් නොමැති හෝ වතු අධිකාරීවරයෙකු නොමැති අවස්ථාවක එහි සිදුවන උපතක් හෝ මරණයක් ලියාපදිංචි කිරීම සඳහා ග්‍රාම නිලධාරී වාර්තාව (ලි.ප.බී.23/ලි.ප.බී.24) පදනම් කරගන්නා ලෙස මෙයින් දන්වමි.

05. එසේම වතුවල සිදුවන මරණ ලියාපදිංචි කිරීමේ කටයුතු ඉදිරියටත් අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සිදු කරන හෙයින් ලියාපදිංචි වතුවල සිදුවන උපත්, මරණ වලට අදාළ වාර්තා, (ලි.ප.බී.23)/(ලි.ප.බී.24) කෙලින්ම අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත යොමු කළයුතු බවට ග්‍රාම නිලධාරී වරුන් දැනුවත් කිරීමට පියවර ගත යුතු වේ.

06. මේ පිළිබඳව සියලුම උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරු දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසද මෙයින් දන්වා සිටිමි.

OIC

ඩබ්.ආර්.ඒ.එන්.එස් විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත :-

1.ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස සහ අ.ක.ස.

2.සියලුම දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කා.දැ.ගැ.සඳහා සහ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරීවරුන් දැනුවත් කිරීම සඳහා

3.සියලුම නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරන් හා දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කා.දැ.ගැ.ස. සහ සියලුම ග්‍රාම නිලධාරීවරුන් සහ උප්පැන්න,මරණ රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීම සඳහා

4. දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියලුම විධායක හා මාණ්ඩලික නිලධාරීන් වෙත - අ.ක.ස.